

# හිම බිමේ සුදු රෝස 1

පර්ත් හි
විද්‍යානි මනතුංග ලියන
නව කතාව

දුම්රිය ඉදිරියට ඇදෙන්නේ ඉබි ගමනින් යැයි මට සිතේ. එහෙත් එය වේගයෙන් යන්නේය හෝ නොයන්නේය යන කරුණ මත මට අයිති දවස තුළ සිදුවෙන වෙනස්කමක් නොමැත. 'මා මේ පැමිණ ඇත්තේ තේරුමක් ඇති ගමනක්ද?' මා ප්‍රශ්න කරගන්නේ මගෙන්මය. මා පසුගිය දෙසැම්බරයේ මේ බිමෙන් සමුගෙන ගියේ නැවත, මෙවැනි ගමනක් පැමිණීමේ බලාපොරොත්තුවෙන් නොවේ. එහෙත් මා බලාපොරොත්තු නොවූ ආකාරයේ සම්බන්ධතාවයක් මේ පර්ත් නුවරත් හෝ මගේ ජීවිතයත් අතර ඇත යන හැඟීම, මා මේ ගමන පැමිණීමට පෙළඹවූවා විය හැකිය.

'පුතා ආපහු කවද විතරද එන්න බලපොරොත්තුව?

මා පිටත්වීමට දින දෙක තුනකට පමණ පෙර අම්මා එසේ ඇසුවේ මා දක්වන නිහැඩියාව ඈට දරා ගැනීමට නොහැකි තැන විය යුතුය. කෙලින්ම පිළිතුරක් නොදී මම කල්පනාවට වැටුණෙමි.

'තවම තීරණයක් නැත්නම් කමක් නැහැ'

ඇය කීවේ දයාබරිත හඬකිනි. එහෙත් ඒ හඬේ දුක ගැබ්වී තිබෙනු මට දැනුනි. මම ඇය අසලට ගොස් ඇගේ අතින් අල්ලාගෙන පුටුවක වාඩි කෙරෙව්වෙමි. මා ඇය අසලම පුටුවේ වාඩි උනද වචන අහුලා ගැනීමට නොහැකි වූ හදවත ඈ වෙනුවෙන් හඬා වැටෙනු මට දැනේ. ඇටද ඒ බවක් දැනෙන්නට ඇත.

'පුතා අපි ගැන දුක්වෙන්න එපා. පුතාට ඇති තරම් කාලයක් අරගන්න තීරණයක් ගන්න. හැබැයි මට ඉඳහිටවත් කෝල් එකක් නොදී ඉන්න එපා'

'පිස්සුද අම්මෙ... මම කලින් පිට ඉන්නැද්දිත් අම්මට කතා නොකර හිටියෙ නැහැනෙ'

ඔව්... නමුත් ඉස්සරට වඩා තත්වය දැන් වෙනස්. ඉස්සර ඔයා රටින් පිටවෙලා හිටයෙ ඉගෙනීම වෙනුවෙන්. අරමුණක් තිබුණ. ආපහු එන දවසක් ගැන බලාපොරොත්තුවක්, තීරණයක් තිබුණ.'

'දැනුත් එහෙම හිතෙනව... ඔයාට කැමැත්තක් කරන්න නිදහස තාත්තගෙනුත් මගෙනුත් ඔයාට තියෙනව... ඔයා දැන් වැඩිහිටි කෙනෙක්. නමුත් තීරණයක් ගන්න කලින් අපිට දැන්නුවොත් ඒ ගැන අපි දෙන්නම සතුටු වෙනව... තාත්ත මට කිව්ව මේ බව ඔයාට කියන්න කියල... පුතා දන්නවනෙ අපිට ඔයා ඇරනහම වෙන බලාපොරොත්තු නැති බව'

'මම දන්නව අම්ම. අම්මයි තාත්තයි මගේ තීරණය වෙනුවෙන් අවසර දුන්න එක ගැන මට හරිම සතුටුයි. නමුත් මට දැන්ම හරියටම කියන්න බැහැ මම ආපහු එන දවසක් ගැන'

එදා ඒ දෙබස එතැනින් අවසන් වූයේ අම්මාගේ පැනයට



ලංකාවෙන් පිටඋනයි කියල වෙනසක් නැහැ. එකම ප්‍රශ්න වැලක් තමයි අපේ රටේ මිනිස්සු කොහෙදි හම්බඋණත් කෙනෙක්ගෙන් අහන්නෙ

පිළිතුරක් නොමැතිවය. ඊට දින ගණනාවකට පසු අද ද, සැතපුම් දහස් ගණනකින් මා ඇගෙන් ඈත්වී සිටියදී ද එයට පිළිතුරක් දීමට මම අපොහොසත් වෙමි.

දුම්රිය සෑම නැවතුමක් පාසාම නවත්වමින් ඉදිරියට යයි. මා සිටි මැදිරිය තුළ සිටියේ වයසක පිරිමි කෙනෙක්ද ඔහුගේ බිරිඳ යැයි සිතිය හැකි තැනැත්තියක් ද පමණි. වරින්වර දෙදෙනා කිසිවක් පිළිබඳව කෙටි සංවාදයක යෙදෙති. බටහිර(සමාජ ක්‍රමයක් පවතින) රටක දීර්ඝ විවාහ ජීවිතයකට හිමිකම් කියන දෙදෙනෙක්, කොයිතරම් වාසනාවක්ද. එහෙත් දැන් දැන් අපේ රටේ තත්වයද මේ බටහිර රටවලට දෙවෙනි නොවේ. මා දන්නා පවුල් කීයක් මේ වන විටත් වෙන්වී තිබේද? ඒ හැරත් මේ ජෝඩුව විවාහ වුණේ මේ ඊයේ පෙරේදා වෙන්නත් පුළුවන්. මා මේ වයසට එනවිට මගේ තත්වය කුමක් වේද? මගේ මුවගට සිනහවක් නැගුණේ නිතැතිනි. මට හිතෙන දේවල්...

තව පසුකිරීමට ඇත්තේ නැවතුම් කිහිපයකි. බේස්වෝටඅ නැවතුමෙන් මා බැසගත යුතුය. ඉතිරි දුර යාමට කුලී රථයක් ගන්නවා යැයි සිතුවෙමි. එහෙත් පීටර් අන්කල් නම් කීවේ ඔහුට ඇමතුමක් දෙන ලෙසටය. මා එන බව කල්තියා ඔහුට දැන්වූයේ ඔවුන් ගෙදර නොසිටියහොත් යන සැකය මතය.

'පුතා දැන් කොහොමද එන්නෙ'

'කෝච්චියේ ඇවිත් බේස-'වෝටඅ ස්ටේෂන් එකෙන් ටැක්සියක් ගන්නව'

'අපෝ ටැක්සිවලට වියදම් කරන්න එපා. මම එන්නම් එක්කන් යන්න. ඒ නැතත් ඉන්න තැන කිව්වොත් මට පුළුවන් එතනටම එන්න'

'එපා අන්කල් කරදර වෙන්න එපා. මම එහෙනම් ස්ටේෂන් එකෙන් කෝල් එකක් දෙන්නම්'

'ඔව්... පර්ත් කියන්නෙ ලහිරුට නුපුරුදු තැනක් නෙමෙයිනෙ... ඉතින් කවදද ආවෙ? ආපහු එන බව අපි දැනගෙන හිටියෙ නැහැනෙ. දැන් කොහෙද නැවතිල ඉන්නෙ?'

'අපි ආවහම විස්තර කතාකරමුකො අන්කල්'

'ඔව් ඔව්... පුතා එහෙනම් එන්නකො'

මා දුරකථනයේ කතාව එසේ අවසන් කළේ ඔය ප්‍රශ්න වැලට පිළිතුරු කලින් සකස් කරගත යුතුයැයි සිතමිනි. 'ලංකාවෙන් පිටඋනයි කියල වෙනසක් නැහැ. එකම ප්‍රශ්න වැලක් තමයි අපේ රටේ මිනිස්සු කොහෙදි හම්බඋණත් කෙනෙක්ගෙන් අහන්නෙ' නමුත් ප්‍රශ්න හා පිළිතුරු සම්බන්ධකරමින් සිටීමට මට උවමනාවක් වූයේ නැත. ඒ වෙලාවට එන හැටියකට යමක් කියනවා යයි. සිතාගතිමි.

මා දුම්රිය දොරටුවෙන් පිටවුණේ කුලී රථයක් ගන්නවාද එසේ නැතිනම් පීටර් අන්කල්ට කතා කරනවාදැයි දෙගිඩියාවක් ඇතිවය. කාට කතාකරන්නත් කලින් දුරකථනයක් ඇති තැනක් ගැන විමසිලිමත් විය යුතුය.

'ෆෝන් එකක් නම් මේ ළඟම කොහේහරි ඇති' යන්න සිතමින් මම වේදිකාව ඔස්සේ ඉදිරියට පියවර තැබුවෙමි. මා පුදුමයට පත්කරමින් මා සිටින දෙසට පෙරගමන් කරමින් සිටියේ පීටර් අන්කල්ය.

'මට හරි සතුටු හිතුන පුතා කතාකළාම. ඒ කතාකරපු වෙලාවෙ හැටියට මේ කෝච්චියේ තමයි එන්න ඕනෙ කියල මම හිතුව' ඉක්මන් ගමනින් මා වෙතට ආ ඔහු මගේ සුරත අල්ලා තදින් සොලවන ගමන් කීවේය..

මා පිළිතුරු දෙන්නට කලින්, ඔහු

'යමු පුතා කාරෙකට. කොහොමද තාත්ත, අම්ම තාත්ත දෙන්නම සනීපෙන්ද?' යි ඇසුවේය.

මට පාර්සලය සිහිවූයේ එවිටය.

දෙවියෝ සාක්කි... මා පර්සලය කෝච්චියේ අමතක කර ඇත. මේ ගමන මෙතරම් ඉක්මණින් මා ආවේ ඒ පාර්සලය වෙනුවෙන් ලැබුණු උපදෙස්වලට අනුවය. නමුත් දැන් මා කරගෙන ඇත්තේ කුමක්ද?...

'මොකෝ පුතා?'

'අයියෝ හරි වැඩේනෙ, අංකල්. මම ගෙනාපු පාර්සලය අමතක කරලනෙ කෝච්චියෙ'

'ආ ෆෙගෙට් ඉට් පුතා. ෆොගෙට් ඉට්. පුතා ආවනෙ ඒ ඇති'

'දැන් මොකද මම කරන්නෙ. මිඩ්ලන්ඩ්වලට ගියත් මම යන්න කලින් කෝච්චිය ආපහු පර්ත් එයි. කවුරුහරි දැකල පාර්සලය බාර දුන්නත් ඒක ලැබෙනකොට දවස් කීපයක් යයි. බලන්නකො මම කරගත්ත වැඩක්... ඕක දෙන්නමයි අන්කල් මම ආවෙ'

'අයි... සේ ෆොගෙට් ඉට් සන්... පාර්සලය මොකද්ද? පුතා ඉන්නවනෙ. පුතාගෙ තාත්තයි මමයි කොයි කාලයක් තිස්සෙද අඳුරන්නෙ. ෆ්‍රෙන්ඩ්ෂිප් එකයි වටින්නෙ. ලෙට්ස් ගෝ'

පීටර් අන්කල් මට මේ දක්වන හෘදයාංගමතාවය මගේ සිත තව තවත් පසුතැවිල්ලට පත්කරයි. නමුත් දැන් මක්කරන්නද? අප යනවිට ගෙදර සිටියේ ඇන්ටි පමණි. පවුලේ අනික් සාමාජික සාමාජිකාවන් ඔවුන්ගේ වැඩ කටයුතු සඳහා පිටත්ව යන්නට ඇත. දිනේෂ් සිටියා නම් තත්වය මීට වඩා තවත් හොඳවනු ඇත. නමුත් ජානකී නම් නැති එකමයි කාරිය. මා නිවසින් පිටත් වී යනතුරු කොහේ හෝ ඉන්නා තැනක එසේම තැන්පත් වී සිටිනවා නම් මැනවැයි මගේ සිත දහස්වර පතයි.

පාර්සලය ගැන අන්කල් ඇන්ටීට කියන්නට නොගියේය. 'ඒක හොඳයි මං ගියාට පස්සෙම කියන එක. නැත්නම් හිත නරක්කර ගනී. දැන් හිතනව ඇත්තෙ ගෙනාපු දෙයක් පහුවෙලා අරන් එයි කියල හරි මුකුත් ගෙනාවෙ නැහැ කියන එක හරිනෙ. ඒක හොඳයි මඟ අමතක වුණා කියල දැනගන්නවට වඩා' හිත විවිධ සිතිවිලිවල පටලැවේ.

'ඉතින් කොහොමද පුතා සැපසනීප. මොකද මේ ගිය පයින් ආපහු ආවෙ... ලංකාවෙ දේශගුණේ අල්ලන් නැහැ කියල හිතුනද? එහෙම නැත්නම් මෙහෙ දේශගුණේ වැඩිය හොඳයි කියල හිතුනද?'

ළබන කළාපයට